පාලි භාෂාවේ සන්ධි

# පාලි භාෂාවේ සන්ධි

*සන්ධි පිළිබඳ දී ඇති නිර්වචන*.....................

- **පූර්ව පර වර්ණයොඃ සන්ධානං සන්ධි** (*පූර්ව පර වර්ණ එක් කිරීම සන්ධි නම් වේ.*)
- **සන්ධියන්ති එත්ථ පදානි අක්ඛරානි චාති සන්ධි** (*පද හා අකුරු සන්ධි කරන නිසා සන්ධි නම්.*)

වර්ණ දෙකක ඉතා ලං බව සන්ධියයි. වෙන් වෙන්ව තිබෙන අකුරු දෙකක් ලෝප, ආදෙශ, ආගම ආදී ව්‍යාකරණ රීති ආධාරයෙන් එකට ගැලපීම සන්ධි නම් වේ. අකුරුවල සම්මොධානය (එකතුවීම) සන්ධි වලින් සිදුවේ. ***වෙන් වෙන් ව ඇති ලී කැබලි දෙකක් ගෙන එකට ගලපා එක් ලීයක් සේ සකස් කරන්නාක් මෙන් වෙන් වෙන්ව ඇති අකුරු දෙකක් එක්ව ගැලපීම සන්ධි නම්*** **වේ**. විශේෂයෙන් සන්ධි කාර්යයන් සිද්ධ වන්නේ **මුල් පදයේ අග අකුරත් අග පදයේ මුල් අකුරත්** සමගය .

## ........සන්ධිවලින් ලැබෙන ප්‍රයෝජන........

- භාෂාව කෙටි කිරීම.
- උච්චාරණයහි කර්කෂ භාවය දුරලීම.
- භාෂාවේ සුබෝච්චාරණය ඇතිකරලීම.
- භාෂාවේ ක්‍රමවත් බව ඇතිකරලීම.
- අසන්නාට ප්‍රියවීම.
- ලේඛනයේ දී පහසුවීම.
- භාෂාවේ මට සිලිටු බව ඇතිවීම.
- ගාථා බන්ධනයේ දී ලඝු ගුරු භේදය ආරක්ෂා කිරීම.
- භාෂාවේ සංක්ෂිප්ත බව ඇතිවීම.

## **************පාලි භාෂාවී භාවිතාවන සන්ධි*************

- ✓ ස්වර සන්ධි
- ✓ බ්‍යඤ්ජන සන්ධි
- ✓ නිග්ගහීත සන්ධි
- ✓ වෝමිස්සක සන්ධි හෙවත් ප්‍රකෘතිභාව සන්ධිය.

## <<<<<<<<<u>සන්ධි හඳුනාගැනීමේ ලක්ෂණ</u>>>>>>>>>

ස්වර සන්ධිය :- *පූර්ව පදයේ අග සහ අග පදයේ මුල ස්වයක් වීම.*

බ්‍යඤ්ජන සන්ධිය :- *මුල් පදයේ අග ස්වරයක් සහ අග පදයේ මුල ව්‍යඤ්ජනයක් වීම.*

නිග්ගහීත සන්ධිය :- *මුල් පදයේ අග නිග්ගහීතයක් (බිංදුවක්) සහ අග පදයේ මුල ස්වරයක් හෝ ව්‍යඤ්ජනයක් වීම.*

වොමිස්සක සන්ධිය :- *මිශ්‍ර වූ ස්වර ව්‍යඤ්ජන අතර සිදුවන සන්ධිය වෝමිස්සක සන්ධි නම් වේ.*

## ★★★★★පාලි භාෂාවේදි සිදුවන සන්ධි කාර්යයන්★★★★★

- ✓ ලෝපය :- අකුරු නොකියා හැරීම.
- ✓ ආදේශය :- අකුරක් වෙනුවට අකුරක් පැමිණාවීම.
- ✓ ආගම :- තිබෙන අකුර ඉවත් නොකොට තවත් අකුරක් පැමිණාවීම.
- ✓ ද්විත්වය :- එක අකුර දෙකක් බවට පත්වීම.
- ✓ දීර්ඝය :- හ්‍රස්ව අකුර දීර්ඝ වීම.
- ✓ සෘස්වය :- දීර්ඝ අකුර හ්‍රස්ව වීම.
- ✓ විපර්යාසය :- අක්ෂරවල ස්ථාන මාරුවීම.
- ✓ ආරෝහණය :- ව්‍යඤ්ජනය ස්වරය කරා පැමිණාවීම.

**ලෝපය**

චක්කං+ ඉව
චක්කං+ [ඉ]+ ව
චක්කංව

**ආදේශය**

බන්දුසස+ ඉව
බන්දුසස්+ අ+ ඉව
බන්දුසස් +[අ]+ ඉව
බන්දුසස් +ඉව
බන්දුසස් +එව
බන්දුසෙසව

**ආගම**

න+ ඉමස්ස
න්+ අ+ ඉමස්ස
න්+ අ+ ය්+ ඉමස්ස

නයිමස්ස

**ද්විත්වය**

ස+ පුරිස
ස+ ප්+ උරිස
ස+ ප්+ ප+ උරිස

සප්පුරිස

**දීර්ඝය**

තෙ + අහං
ත්+ එ+ අහං
ත්+ ය්+ අහං
ත්+ ය්+ ආහං

ත්‍යාහං

**හ්‍රස්වය**

යථා+ ඉව
යථ්+ ආ+ ඉව
යථ්+ අ+ ර්+ ඉව

යථරිව

**විපර්යාසය**

බහු+ ආබාධ
බ+ හ්+ උ+ ආබාධ
බ+ හ්+ ව්+ ආබාධ
බ+ ව්+ හ්+ ආබාධ
බව්හාබාධ

**ආරෝහණය**

ලෝක+ අගෙගා
ලොක්+ අ+ අගෙගා
ලොක්+ [අ]+ අගෙගා
ලොක්+  අගෙගා
ලොකගෙගා

සන්ධි ***අභ්‍යන්තර සන්ධි, බාහිර සන්ධි*** යැයි කොටස් දෙකකට බෙදයි. එකම පදයක **ප්‍රකෘතිය හා ප්‍රත්‍යය** අතර සිදු වන සන්ධිය අභ්‍යන්තර සන්ධි නම් වේ.

| | | | |
|---|---|---|---|
| බුද්ධ | + ඔ | = | බුද්ධො |
| බුද්ධ | + ස | = | බුදධසසස |
| ආචරිය | + යො | = | ආචරියො |

**පද දෙකක් හෝ ප්‍රකෘති දෙකක්** අතර සිදුවන සන්ධිය බාහිර සන්ධි නම් වේ.

| | | |
|---|---|---|
| ත්වං | + අසි | ත්වමසි |
| බන්ධුස්ස | + ඉව | බන්ධුස්සෙව |
| න | + ඉමස්ස | නයිමස්ස |

# ස්වර සන්ධිය

**"සරානං සරෙසු වා සන්ධි සර සන්ධි"**

**"ස්වරයො: සන්ධානං ස්වර සන්ධි"**

යන විග්‍රහයන්ට අනුව ස්වර දෙකක් අතර සිදු කෙරෙන **සන්ධානය** හෙවත් එකට ගැලපීම ස්වර සන්ධි නම් වේ. ස්වර සන්ධියේදී පහත සඳහන් සන්ධි කාර්යයන් සිදුවේ. එනම්

- ✓ පූර්වස්වර ලෝපය
- ✓ පර ස්වර ලෝපය
- ✓ ස්වරාදේශය
- ✓ ව්‍යඤ්ජනාදේශය
- ✓ පූර්ව ස්වර දීර්ඝය
- ✓ පරස්වර දීර්ඝය
- ✓ ව්‍යඤ්නාගමය

## ☞☞☞☞ පූර්වස්වර ලෝපය ☜☜☜☜

සන්ධි වෙන්නාවූ පද දෙකේ මුල් පදයේ අග ඇති ස්වරය ලොප් කිරීම හෙවත් කපා හැරීම පූර්ව ස්වර ලෝපය නම් වේ. එය **"සරා සරෙ ලොපං" "අනන්තරෙ සරෙ පරෙ සරා ලොපං පප්පොන්ති"** යන බාලාවතාර සූත්‍රයට හා වෘත්තියට අනුව සිදුවේ.

උදාහරණ.........................

| | |
|---|---|
| තීනි+ ඉමානි | (විසන්ධිය) |
| තීන්+ ඉ+ ඉමානි | (පුබ්බමධොඨිත මස්සරං සරෙන වියෝජයෙ) |
| තීන්+ [ඉ]+ ඉමානි | (සරා සරෙ ලොපං) |
| තීන්+ ඉමානි | (නයෙ පරං යුත්තෙ ) |
| තීනිමානි | (සන්ධිය) |
| නොහි+ එතං | (විසන්ධිය) |
| නොහ්+ ඉ එතං | (පුබ්බමධොඨිත මස්සරං සරෙන වියෝජයෙ) |
| නොහ්+ [ඉ]+ එතං | (සරා සරෙ ලොපං) |
| නොහ්+ එතං | (නයෙ පරං යුත්තෙ ) |
| නොහෙතං | (සන්ධිය) |

......................පැවරුම්.....................

| | | |
|---|---|---|
| ලෝක + අගෙගා | පඤ්ඤදා+ ඉන්ද්‍රියං | භික්ඛුණී+ ඔවාදො |
| මාතු + උපට්ඨානං | සමෙතු + ආයස්මා | අභිභූ + ආයතනං |
| ධනමෙම+ අත්ථි | සබෙබ+ එව | තයො + අස්සුමමා |
| පන + ඉමෙ | යස්ස+ ඉන්ද්‍රියානි | මම + ඔදනං |

☞☞☞☞ <u>පර ස්වර ලෝපය</u> ☜☜☜☜

සන්ධි වෙන්නාවූ පද දෙකේ පර පසු පදයේ මුල් ස්වරය ලොප් කිරීම හෙවත් කපා හැරීම පර ස්වර ලෝපය නම් වේ. **"වා පරො අසරූපා" "අසමාස රූපා සරම්හා පරො සරො වා ලුප්‍යතේ"** යන බාලාවතාර සූත්‍රයට හා වෘත්තියට අනුව සිදුවේ.

උදාහරණ.......................

සො+ අහං (විසන්ධිය)
ස්+ ඔ+ අහං (පුබ්බමධොඨිත මස්සරං සරෙන වියෝජයෙ)
ස්+ ඔ+ [අ]හං (වා පරො අසරූපා)
ස්+ ඔ+ හං (නයෙ පරං යුතෙත )

සොහං (සන්ධිය)

ඉති+ අපි (විසන්ධිය)
ඉත්+ ඉ+ අපි (පුබ්බමධොඨිත මස්සරං සරෙන වියෝජයෙ)
ඉත්+ ඉ+ [අ]පි (වා පරො අසරූපා)
ඉත්+ ඉ+ පි (නයෙ පරං යුතෙත )

ඉතිපි (සන්ධිය)

......................**පැවරුම්**....................

| | | |
|---|---|---|
| යස්ස+ ඉදානි | සඞ්ඛදා+ ඉති | ඡායා+ ඉව |
| අස්සමණී+ අසි | කතකඞ්ඛදූ+ අසි | ආකාසෙ+ ඉව |
| තෙ + අපි | වනෙද+ අහං | චත්තාරො+ ඉමෙ |
| පන+ ඉමෙ | චක්ඛු+ ඉන්ද්‍රියං | කථා+ එවකා |

## ☞☞☞☞ ස්වරාදේශය ☜☜☜☜

ස්වරයක් වෙනුවට තවත් ස්වරයක් ආදේශ කිරීම ආදේශය නම් වේ. පූර්ව ස්වරය ලොප් කළ විට පරස්වරයට අසවර්ණයක් ආදේශ වීම සිදුවේ. මෙය ***"ක්වචාසවණ්ණාං ලුත්තෙ" "සරෙ ලුත්තෙ පරසරසස ක්වචි අසවණ්ණො හොති ඉ උ ඉව්වෙතෙසං ධානාසන්නා ඒ ඕ"*** යන බාලාවතාර සූත්‍රයට හා වෘත්තියට අනුව සිදුවේ.

ඉ > ඊ = එ      උ > ඌ= ඔ

උදාහරණ..................

| | |
|---|---|
| බන්ධුස්ස+ ඉව | *(විසන්ධිය)* |
| බන්ධුස්ස්+ අ+ ඉව | *(පුබ්බමධොඨිත මස්සරං සරෙන වියෝජයෙ)* |
| බන්ධුස්ස+ [අ]+ ඉව | *(සරා සරෙ ලොපං)* |
| බන්ධුස්ස්+ එව | *(ක්වචාසවණ්ණාං ලුත්තෙ )* |
| බන්ධුස්ස්+ එව | *(නයෙ පරං යුත්තෙ )* |
| බන්ධුසෙසව | *(සන්ධිය)* |
| | |
| චන්ද+ උදය | *(විසන්ධිය)* |
| චන්ද්+ අ+ උදය | *(පුබ්බමධොඨිත මස්සරං සරෙන වියෝජයෙ)* |
| චන්ද් [අ]+ උදය | *(සරා සරෙ ලොපං)* |
| චන්ද්+ ඔදය | *(ක්වචාසවණ්ණාං ලුත්තෙ )* |
| චන්ද්+ ඔදය | *(නයෙ පරං යුත්තෙ )* |
| චනෙදාදය | *(සන්ධිය)* |

......................පැවරුම්.....................

උප + ඉතො අප+ ඉතො ප+ ඉක්ඛති යථා + උදක
ජින + ඊරිතං මහ+ උදධි වි+ උදක වාත + ඊරිතං
ණා + උපෙති උප+ ඉක්ඛති සීත + උදකං වාම+ ඌරු
කඞ්ඛා+ ඉව

☞☞☞☞ <u>ව්‍යඤ්ජනාදේශය</u> ☜☜☜☜

ස්වරයක් වෙනුවට ව්‍යඤ්ජනයක් ආදේශ වීම ව්‍යඤ්ජනාදේශය නම් වේ.සංස්කෘත භාෂාවේ ආදේශය සතුරෙකුට සමාන කොට ඇත.**ශත්‍රුවදාදෙශඃ** එය පහත සඳහන් සූත්‍ර වලට අනුව සිදුවේ.

ඒ = ය් > "*යමේදන්තස්සාදෙසො*" "*සරෙ පරෙ අන්තස්ස ඒකාරස්ස ක්වචි යො ආදෙසො හොති*"

ඉ = ය් > "*ඉවණ්ණොයං නවා*" "*සරෙ පරෙ ඉවණ්ණස්ස යො නවා හොන්ති.*"

උ,ඔ= ව් > "*වමොදුදන්තානං*" "*සරෙ පරෙ අන්තොකාරූකාරං ක්වචි වෝ ආදේසො හොති.*"

උදාහරණ.........................

තෙ + අජ්ජ (විසන්ධිය)
ත්+ එ+ අජ්ජ (*පුබ්බමධොඨිත මස්සරං සරෙන වියෝජයෙ*)
ත්+ [එ]+ අජ්ජ (*සරා සරෙ ලොපං*)
ත්+ ය්+ අජ්ජ (යමේදන්තස්සාදෙසො)
ත්+ ය්+ අජ්ජ (*නයෙ පරං යුත්තෙ* )
ත් යජ්ජ
ත්‍යජ්ජ (*සන්ධිය*)

| | |
|---|---|
| පති+ අන්තං | *(විසන්ධිය)* |
| පත්+ ඉ+ අන්තං | *(පුබ්බමධොඨිත මස්සරං සරෙන වියෝජයෙ)* |
| පත්+ [ඉ]+ අන්තං | *(සරා සරෙ ලොපං)* |
| පත්+ ය්+ අන්තං | (ඉවණෙණායං නවා) |
| පත්+ ය්+ අන්තං | *(නයෙ පරං යුත්තෙ )* |
| පත් යන්තං | |
| පත්‍යන්තං | *(සන්ධිය)* |
| | |
| සො+ අස්ස | *(විසන්ධිය)* |
| ස්+ ඔ+ අස්ස | *(පුබ්බමධොඨිත මස්සරං සරෙන වියෝජයෙ)* |
| ස්+ [ඔ]+ අස්ස | *(සරා සරෙ ලොපං)* |
| ස්+ ව්+ අස්ස | (වමොදුදන්තානං) |
| ස්+ ව්+ අස්ස | *(නයෙ පරං යුත්තෙ )* |
| ස් වස්ස | |
| සවස්ස | *(සන්ධිය)* |

......................*පැවරුම්*.....................

| | | | |
|---|---|---|---|
| වුත්ති+ අස්ස | ව්+ අඤ්ජන | වි+ ආබාතො | සත්තමී+අත්ථෙ |
| නදී + ආ | නමාමි+ අහං | වාපි+ ආදයො | තෙ+ අහං |
| තෙ + අයං | මෙ+ අයං | අථබො+ අස්ස | සු+ ආගත |
| සු + අක්ඛාත | අනු + අද්ධමාස | නතු + එව | සො+ අයං |
| යාවතකො+ අස්ස | | | |

☞☞☞☞ <u>ව්‍යඤ්ජනාගමය</u> ☜☜☜☜

අකුරක් වෙනුවට එම අකුර නොකපා තවත් අකුරක් පැමිණවීම ආගම නම් වේ. ආගම සංස්කෘතයේ මිතුරෙකුට සමාන කොට ඇත. **(මිත්‍රවදාගමඃ)** එය ***"යවමදනතරළා චාගමා"*** ***"සරේ පරේ යාදයො ආගමා වා හොන්ති."*** යන බාලාවතාර සූත්‍රයට හා වෘත්තියට අනුව සිදුවේ.

උදාහරණ.........................

න+ ඉමස්ස (විසන්ධිය)
න්+ අ+ ඉමස්ස (පුබ්බමධොඨිත මස්සරං සරෙන වියෝජයෙ)
න්+ අ+ ය්+ ඉමස්ස (යවමදනතරළා චාගමා)
න්+ අ+ ය්+ ඉමස්ස (නයෙ පරං යුතෙත )
න්+ අ+ යිමස්ස (නයෙ පරං යුතෙත )
නයිමස්ස (සන්ධිය)

.......................පැවරුම්.....................

භායාමි+ එව තෙ + එව පරි+ අන්ත ති+ අද්ධ
සො + එව යථා+ ඉදං ආදිච්චො+ එව

ති+ අඞ්ගිකං (විසන්ධිය)
ත්+ ඉ+ අඞ්ගිකං (පුබ්බමධොඨිත මස්සරං සරෙන වියෝජයෙ)
ත්+ ඉ+ ව්+ අඞ්ගිකං (යවමදනතරළා චාගමා)
ත්+ ඉ+ ව්+ අඞ්ගිකං (නයෙ පරං යුතෙත )
ත්+ ඉ+ වඞ්ගිකං (නයෙ පරං යුතෙත )
තිවඞ්ගිකං (සන්ධිය)

.......................පැවරුම්.....................

භූ + ආදයො ප + වුච්චති ති+ අඞ්ගිකං
ති + අඞ්ගුලං දු + අඞ්ගිකං

ලහු+ එස්සති (විසන්ධිය)
ලහ්+ උ+ එස්සති (පුබ්බමධොඨිත මස්සරං සරෙන වියෝජයෙ)
ලහ්+ උ+ ම්+ එස්සති (යවමදනතරළා චාගමා)
ලහ්+ උ+ ම්+ එස්සති (නයෙ පරං යුත්තෙ )
ලහ්+ උ+ මෙස්සති (නයෙ පරං යුත්තෙ )
ලහුමෙස්සති (සන්ධිය)

......................පැවරුම්......................

ඉධ + ආහු එක + එකස්ස ඉධ+ එකච්ච ඉධ + ඉජ්ඣති
එව + එතස්ස

අත්ත + අත්තං (විසන්ධිය)
අත්ත්+ අ+ අත්තං (පුබ්බමධොඨිත මස්සරං සරෙන වියෝජයෙ)
අත්ත්+ අ+ ද් අත්තං (යවමදනතරළා චාගමා)
අත්ත්+ අ+ ද් අත්තං (නයෙ පරං යුත්තෙ )
අත්ත්+ අ+ දත්තං (නයෙ පරං යුත්තෙ )
අත්තදත්තං (සන්ධිය)

......................පැවරුම්......................

සම්මා + එව උ + අපාදි යාව + එව අඤ්ඤ+ අත්‍ථු

ඉතො+ ආයති (විසන්ධිය)
ඉත්+ ඔ+ ආයති (පුබ්බමධොඨිත මස්සරං සරෙන වියෝජයෙ)
ඉත්+ ඔ+ න්+ ආයති (යවමදනතරළා චාගමා)
ඉත්+ ඔ+ න්+ ආයති (නයෙ පරං යුත්තෙ )
ඉත්+ ඔ+ නායති (නයෙ පරං යුත්තෙ )
ඉතොනායති (සන්ධිය)

......................පැවරුම්......................

චිරන්+ ආයති      චි + ඉතවා

තස්මා+ ඉහ (විසන්ධිය)
තස්මි+ ආ+ ඉහ (පුබ්බමධොධීත මස්සරං සරෙන වියෝජයෙ)
තස්මි+ ආ+ ත්+ ඉහ (යවමදනතරළා චාගමා)
තස්මි+ ආ+ ත්+ ඉහ (නයෙ පරං යුතෙ )
තස්මි+ ආ+ තිහ (නයෙ පරං යුතෙ )
තස්මාතිහ (සන්ධිය)

.......................පැවරුම්.....................

අජ්ජ+ අග්ගෙ

සබ්භි+ එව (විසන්ධිය)
සබ්භ්+ ඊ+ එව (පුබ්බමධොධීත මස්සරං සරෙන වියෝජයෙ)
සබ්භ්+ ඊ+ ර්+ එව (යවමදනතරළා චාගමා)
සබ්භ්+ ඊ+ ර්+ එව (නයෙ පරං යුතෙ )
සබ්භ්+ ඊ+ රෙව (නයෙ පරං යුතෙ )
සබ්භිරෙව (සන්ධිය)

.......................පැවරුම්.....................

පුන+ එති   පාතු + අහොසි   පුන+ උක්ත   නි+ උත්තර

ඡ+ අභිඤ්ඤා (විසන්ධිය)
ඡ්+ අ+ අභිඤ්ඤා (පුබ්බමධොධීත මස්සරං සරෙන වියෝජයෙ)
ඡ්+ අ+ ළ්+ අභිඤ්ඤා (යවමදනතරළා චාගමා)
ඡ්+ අ+ ළ්+ අභිඤ්ඤා (නයෙ පරං යුතෙ )
ඡ්+ අ+ ළභිඤ්ඤා (නයෙ පරං යුතෙ )
ඡළභිඤ්ඤා (සන්ධිය)

……………………පැවරුම්…………………..

ඡ + ආයතනං ඡ+ අංග ඡ+ අංසා

පුථ + එව (විසන්ධිය)
පුථ්+ අ+ එව (පුබ්බමධොඨිත මස්සරං සරෙන වියෝජයෙ)
පුථ්+ අ+ ග්+ එව (යවමදනතරළා චාගමා)
පුථ්+ අ+ ග්+ එව (නයෙ පරං යුත්තෙ )
පුථ්+ අ+ ගෙව (නයෙ පරං යුත්තෙ )
පුථගෙව (සන්ධිය)

……………………පැවරුම්…………………..

පා+ එව

☞☞☞☞ **<u>පූර්ව ස්වර දීර්ඝය</u>** ☜☜☜☜

සන්ධි වෙන්නා වූ පද දෙකේ පූර්ව පදයේ අග ඇති ස්වරය දීර්ඝ වීම පූර්ව *ස්වර දීර්ඝය* නමින් හැඳින්වේ. එය ***"පුබ්බො ච"*** "***සරෙ ලුත්තෙ පුබ්බෝ ච ක්වචි දීඝං යාති***" යන බාලාවතාර සූත්‍රයට අනුව සිදුවේ.

උදාහරණ…………………..

දෙව+ ඉති (විසන්ධිය)
දෙව්+ අ+ ඉති (පුබ්බමධොඨිත මස්සරං සරෙන වියෝජයෙ)
දෙව්+ අ+ [ඉ]ති (වා පරෝ අසරූපා)
දෙව්+ ආති (පුබ්බො ච)
දෙවාති (සන්ධිය)

කිංසු+ ඉධ (විසන්ධිය)
කිංස්+ උ+ ඉධ (පුබ්බමධොධීන මස්සරං සරෙන වියෝජයෙ)
කිංස්+ උ+ [ඉ]ධ (වා පරෝ අසරූපා)
කිංස්+ ඌධ (පුබ්බො ච)
කිංසූධ (සන්ධිය)

......................පැවරුම්.....................

| | | |
|---|---|---|
| ලොකස්ස+ ඉති | වි+ අතිපතන්ති | වි+ අතිනාමෙති |
| සංඝාටි + අපි | ජීවිතහෙතු + අපි | විජ්ජු + ඉව |
| සාධු + ඉති | අති+ ඉතො | තිණි + ඉව |
| බහු + උපකාරං | යානි+ ඉධ | ගච්ඡාමි + ඉති |

## ☜☜☜☜ <u>පරස්වර දීර්ඝය</u> ☞☞☞☞

සන්ධි වෙන්නා වූ පද දෙකේ පර පදයේ මුළ ඇති ස්වරය දීර්ඝ වීම පර ස්වර දීර්ඝය නමින් හැඳින්වේ. එය **"දීඝං"** "**බ්‍යඤ්ජනෙ පරෙ ක්වචි දීඝො**" යන බාලාවතාර සූත්‍රයට අනුව සිදුවේ.

උදාහරණ.............

සචෙ+ අයං (විසන්ධිය)
සච්+ එ+ අයං (පුබ්බමධොධීන මස්සරං සරෙන වියෝජයෙ)
සච්+ [එ]+ අයං (සරා සරෙ ලොපං)
සච්+ ආයං (දීඝං)
සචායං (සන්ධිය)

සද්ධා+ ඉධ (විසන්ධිය)
සද්ධ්+ ආ+ ඉධ (පුබ්බමධොධීන මස්සරං සරෙන වියෝජයෙ)
සද්ධ්+ [ආ]+ ඉධ (සරා සරෙ ලොපං)
සද්ධ්+ ඊධ (දීඝං)
සද්ධීධ (සන්ධිය)

......................පැවරුම්.....................

| | | |
|---|---|---|
| බුද්ධ + අනුස්සති | ස + අත්ථිකා | පඤ්ඤදවා + අස්ස |
| තදා + අහං | තථා + උපමං | අත්ථි + උපරතො |
| වි + උපසමො | කම්ම + උපනිස්සයො | ඉතර + ඉතරෙන |
| සු + උපධාරිතං | ඉදානි + අහං | අප්පස්සුතො + අයං |

✈✈✈✈✈✈✈✈✈✈✈✈✈✈✈✈✈✈✈✈✈✈✈✈✈✈✈✈✈✈✈✈✈✈✈

ඇතැම් තැනකදී ස්වරයකින් පර වූ **ඒව** ශබ්දයේ මුළ **එ** කාරයට රි ආදේශ වේ. එවිට **පූර්ව වූ ස්වරය හ්‍රස්ව** බවට පත්වේ. එය **"*එවාදස්සරි පුබ්බො ච රස්සො*"** ***'සරතො පරස්ස ඒවස්සාදි ඒ කාරො රිත්තං නාවා යාති*. පුබ්බො ච ධානාසණනං රස්සං"** යන බාලාවතාර සූත්‍රයට අනුව සිදුවේ.

යථා + ඒව (*විසන්ධිය*)

යථා + රිව (එවාදස්සරි පුබ්බො ච රස්සො)

යථ + රිව

යථරිව (*සන්ධිය*)

තථා + ඒව

✈✈✈✈✈✈✈✈✈✈✈✈✈✈✈✈✈✈✈✈✈✈✈✈✈✈✈✈✈✈✈✈✈✈✈

ස්වර කෙරෙන් පර වූ ව්‍යඤ්ජනය සුදුසු තැන්හිදී දෙකක් බවට පත්වේ. එය **"*පරද්වෙභාවොඨානෙ*"** යන බාලාවතාර සූත්‍රයට අනුව සිදුවේ.

පති+ අන්තං (විසන්ධිය)
පත්+ ඉ+ අන්තං (පුබ්බමධොඨිත මස්සරං සරෙන වියෝජයෙ)
පත්+ ය්+ අන්තං (ඉවණ්ණොණායං නවා)
පච්+ අන්තං
පච්ච්+ අන්තං ( පරද්වෙභාවොඨානෙ)
පච්චන්තං (සන්ධිය)

✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡✡

ඇතැම් තැනකදී **අභි** යන්නට **අබ්භ** ආදේශ වේ. එය **"*අබ්භො අභි*"** යන බාලාවතාර සූත්‍රයට අනුව සිදුවේ.

අභි+ උග්ගතො (විසන්ධිය)
අබ්භ+ උග්ගතො (අබ්භො අභි)
අබ්භ්+ උග්ගතො
අබ්භුග්ගතො (සන්ධිය)

......................***පැවරුම්***.....................

අභි+ ඔකාස අභි+ උග්ගච්ඡති අභි + අක්ඛානං

✶✶ ඇතැම් තැනකදී අධි යන්නට **අජ්ඣ** ආදේශ වේ.

අධි+ ආගම (විසන්ධිය)
අජ්ඣ+ ආගම
අජ්ඣ්+ ආගම
අජ්ඣාගම (සන්ධිය)

.......................පැවරුම්......................

බෝධි + අංග අධි + උපගතො අධි + ඔගහෙත්වා

.......................පැවරුම්......................

පහත සඳහන් සන්ධි පද ස්වර සන්ධියේ කුමන සන්ධි කාර්යයකට අයත්දැයි හඳුනා ගෙන බාලාවතාර සූත්‍ර දක්වමින් පියවරෙන් පියවර සාදන්න.

| | | |
|---|---|---|
| ඵල + අත්ථාය | දණ්ඩ+ ආදීහි | පහරන්තා+ අපි |
| න+ අසක්ඛිංසු | පතා+ ඉති | ධූමරක්ඛ+ අග |
| රාජිනො+ අබ්‍රවුං | මාරෙස්සාම+ ඉති | අවස්සන+ අත්ථාය |
| ආහරථ + ආවුධං | එකස්ස+ අපි | වෙළුපත්ත + අන්තරෙ |
| මුත්තා+ අම්හි | වුත්තංහි+ එතං | ද්වෙ+ ඉමේ |
| මතා+ ඉති | අජ+ එළක | තත්ථ + එතං |
| යස්ස+ අහං | උච්ච+ අවචෙ | සුද්ධි+ ඉති |
| නත්ථි+ ඉදානි | නව+ උදකං | දක්ඛිණෙය්‍ය අග්ගිං |
| පන+ අස්ස | උද්ධුමාත + උදරො | කරණ+ අත්ථාය |
| බ්‍රාහ්මණ+ ඉති | පුන+ එකදිවසං | දස්සා+ අස්ස |
| තස්ස+ එවං | මහා+ ඔඝො | ලොණ+ උදකෙ |
| සා+ අහං | යත්ථ + අහං | එත්ථ + අන්තරෙ |
| යක්ඛ+ ආදයො | පුන+ අපරං | පුර+ උත්තමෙ |

| | | |
|---|---|---|
| බුද්ධ+ උප්පාදෙ | සුගන්ධො+ ඉති | අබ්බන්තරෙ+ එව |
| තත්ථකා+ එව | නග්ගො+ එව | වත්ථ + අලංකාර |
| පති+ අනුභොතුං | න+ අලත්ථ | අජ්ජ+ එව |
| අපරෙ+ අපි | ලභාමි +අහං | රාජ+ අඞගනං |
| එකෙන+ උපායෙන | පන+ එත්ථ | ආදිච්චො+ එව |
| පඨම+ අභිසමයො | භත්ත + උක්බලී | විවෙක+ අභිරතිං |
| පාප+ ඉච්චො | තස්ස+ උපරි | පටි+ එති |
| පුබ්බ+ ආචරිය | උටඨාන+ අධිගතං | යෙන+ ඉමස්ස |
| කුලාවක+ උදර | කල්ලො+අසි | සුරියස්ස+ උග්ගමනං |
| ධජ+ උපමෙහි | කෙනචි+ එව | බහල +ආතපෙ |
| ජරා+ ආතුරො | බොධියා+ එව | පුන+ උපපරික්ඛිත්වා |
| උභොසු+අපි | භටෙහි+ එව | සුළභතිණ+ උදකං |
| නාලිකා+ ඔදනං | අනු+ අගුං | මනුස්ස+ඉන්දො |
| දිට්ඨි+ අනුගතිං | ජානිත්වා+ එවං | ධී+ අත්ථු |
| ජීමුත + උභය | අභූ+ එව | පති+ ඔරොහිත්වා |
| රම්භ+ ඌරු | දාන+ උපකරණ | සුරභි+ ඉව |
| පාද+ අරවින්ද | නර+ ඉස්සර | ගජො+ ඉව |


සන්ධි
ස්වර සන්ධි
පකති සන්ධි
ව්‍යඤ්ජන සන්ධි
නිග්ගහීත සන්ධි
වොමිස්සක සන්ධි
ලෝපය
ආදේශය
ආගම
පූර්ව ස්වර ලෝපය
පර ස්වර ලෝපය
ය
ව
ම
ද්
න
ත
ර
ළ
ග
අසවර්ණා දේශය
ය ආදේශය
ව ආදේශය
දීර්ඝය
පූර්ව
පර
ලෝපය
ආදේශය
ආගම
ස්වර ලෝපය
ව්‍යඤ්ජන ලෝපය
නිග්ගහිත ලෝපය
නිග්ගහිත ආගම
වර්ගාන්තා දේශය
ලකාරා දේශය
මකාරා දේශය
දකාරා දේශය
නිග්ගහිතා දේශය
ආගම
ලෝපය
ආදේශය
ද්විත්වය
ව්‍යඤ්ජනයේ ස්වර දීර්ඝය
ව්‍යඤ්ජනයේ ස්වර හ්‍රස්වය
ස්වරූප ද්විත්වය
විරූප ද්විත්වය
ඔ ආදේශය
ක,ග,ච,ජ,ට,ඩ,ත,ද,ප,බ ආදේශය

●●●●●●●●●● ☸ ☸ ●●●●●●●●●●

**………………සර සන්ධි නිට්ඨිතං…………**